නිපුණතාව 1.0 - ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

නිපුණතා මට්ටම 1.1 - ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි.

**<u>ව්‍යාපාර -</u>**

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි.

- මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික තත්ත්ව මිනිස් අවශ්‍යතා ලෙස හැඳින්වේ.
  උදා-ආහාර,ඇඳුම්,නිවාස,අධ්‍යාපනය,සෞඛ්‍යය

- මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා නම් වේ.
- ආහාර අවශ්‍යතාව සපුරා ගන්නා විවිධ ස්වරූප වන බත්,පාන්,ඉඳි ආප්ප ආදිය වුවමනාවලට නිදසුන් වේ.

**<u>වෙළෙඳපොළ</u>**

- ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණ ගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑම තත්ත්වයක් වෙළඳපොළකි.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට වෙළෙඳපොළ තුළින් භාණ්ඩ හා සේවා සපයා ගනී.

**<u>අභ්‍යාස</u>**

1.අවශ්‍යතා 5ක් නම් කර ඒවාට ගැළපෙන වුවමනා 3 බැගින් ලියන්න.
2.අවශ්‍යතා හා වුවමනා අතර ඇති වෙනස්කම් මොනවාද?